මුළු ආදායම	**196,000,000**	**196,000,000**	**155,112,822**	**79**

3.7 මූල්‍ය රෙගුලාසි 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ දෙපාර්තමේන්තු/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයපළාත් / සභාව වෙත වැය සඳහා වෙන්කළ මුදල් ප්‍රතිපාදන

(රු.)

අනු අංකය	මුදල් ලැබුණේ කිනම් දෙපාර්තමේන්තු වෙන්ද/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන්ද	මුදල් වෙන් කිරීමේ අරමුණ	වෙන් කළ මුදල		තථ්‍ය වියදම	අවසන් වෙන් කළ මුදලේ % ලෙස වෙන් කළ මුදල් උපයෝජනය
			මුල්	අවසාන		
01	දුම්රිය දෙපාර්තමේන්තුව	කාර්ය මණ්ඩලය සඳහා දුම්රිය බලපත්‍ර	150,000	150,000	121,500	81
02	**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** අම්පාර මඩකලපුව ත්‍රිකුණාමලය නුවර මාතර වවුනියා ගාල්ල කුරුණෑගල	කාර්ය මණ්ඩල ගමන් දීමනාව	198,000	198,000	191,941	97
03	කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	කාර්ය මණ්ඩල ලිපි ද්‍රව්‍ය වියදම්	4,519	4,519	4,519	100
04	නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	ජාතික මීලාද් උන් නබි සංවර්ධනය වැඩසටහන	10,000,000	10,000,000	9,557,269	96
05	සියලුම දිස්ත්‍රික් ලේකම් කාර්යාල	මුස්ලිම් පල්ලි සංවර්ධන හා වැඩිදියුණුකිරීමේ වැඩසටහන්	15,000,000	15,000,000	14,506,613	97
මුළු මුදල			**25,352,519**	**25,352,519**	**24,381,842**	**96**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

(රු.)

වත්කම් කේතය	කේත විස්තරය	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව **2021.12.31** දිනට ශේෂය	**2021.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	තවමත් ගිණුම් ගත කිරීමට තිබෙන	වාර්තාකිරීමේ ප්‍රගතිය %ක් ලෙස
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	312,485,000	312,485,000	0.00	100
9152	යන්ත්‍ර හා උපකරණ	43,346,631	43,346,631	0.00	100
9153	භූමිය				
9154	අස්පෘශ්‍ය වත්කම්				
9155	ජීවවිද්‍යාත්මක වත්කම්				
9160	නොනිමි වැඩ				
9180	කල්බදු වත්කම්				

3.9 විගණකාධිපතිගේ වාර්තාව



(144)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඒඒ/සි/ඩීඑම්ආර්/2/2021/07 මඹේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2022 ජූනි 14 දින

අධ්‍යක්ෂ
මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

මුස්ලිම් ආගමික හා සංස්කෘතික දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබෙනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරන අඩුපාඩු

(අ) ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව	ඉදිරියේදී වාර්ෂික වාර්තා නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කාර්ය මණ්ඩලයට උපදෙස් දී ඇති අතර ඒ අනුව ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව

අංක 306/72, පොළඳුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

	නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්වයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වග බලා ගත යුතු වුවත්, වාර්තාවේ 1.2.1(ආ)(iii) ඡේදයේ සඳහන් නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.	කටයුතු කළ යුතු බව.	එම වාර්තා ඉදිරිපත් කරන බව සඳහන් කරමි.
(ii)	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	කොවිඩ් වසංගතය හේතුවෙන් කාර්ය මණ්ඩල පැමිණීමේ ගැටළු ඇතිවූ බැවින් ඇතැම් විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම ප්‍රමාද වූ අතර ඉදිරියේදී එම ප්‍රමාදයන් වලක්වා ගැනීම අපේක්ෂා කරමි.
(iii)	අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පවතින බැවින් අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් පවතින ක්‍රමවේදයෙහි දුර්වලකම් හා අඩුපාඩු දක්නට ඇත. අභ්‍යන්තර විගණක තනතුර සඳහා සුදුසු නිලධාරියකු ලබාදෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ යෙන් කිහිපවරක් ඉල්ලීම් කල අතර ඉදිරියේදී එම තනතුරේ පුරප්පාඩු සම්පූර්ණ කර වඩාත් කාර්යක්ෂම හා විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇතිකිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

(142)

(ආ) නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(i)	1982 අංක 33 දරන වකුග් පනතේ 4 වන පරිච්ඡේදයේ				
	• 43 (2) වගන්තිය		ලියාපදිංචි මුස්ලිම් පල්ලියක, පුණ්‍ය භාරයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 6 ක ප්‍රමාණයක්ද, මුස්ලිම් සිද්ධස්ථානයක වාර්ෂික ශුද්ධ ආදායමෙන් සියයට 10 ක ප්‍රමාණයක් ද, මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලබා දිය යුතු බව සඳහන් වුවද අදාල පල්ලි සහ සිද්ධස්ථාන වෙතින් ලැබිය යුතු නියම මුදල මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලැබෙන බවට පරීක්ෂා කිරීමේ ක්‍රමවේදයක් හඳුනා ගෙන නොතිබුණි.	පනත ප්‍රකාරව ක්‍රමවේදයක් ක්‍රියාත්මක කළ යුතු බව.	මුස්ලිම් පුණ්‍යාධාර අරමුදලට ලබා දිය යුතු පුණ්‍යාධාර ප්‍රමාණය පරීක්ෂා කිරීම සඳහා දැනට ක්‍රමවේදයක් හඳුන්වා දී ඇති අතර එම ක්‍රමවේදය ක්‍රියාත්මක වෙමින් පවතී.
	• 43(8) වගන්තිය		අරමුදලේ ගිණුම් පවත්වා ගැනීමට සහ විගණනය කිරීමට කටයුතු කළ යුතු වුවද, 2016 වර්ෂයේ සිට අරමුදලේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පනතේ විධිවිධාන ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කළ යුතු බව.	2016 වර්ෂයේ සිට 2021 දක්වා ගිණුම් පිළියෙළ කර වකුග් සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත වකුග් සභාවේ අනුමැතිය ලද විගස එම මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත යොමු කරන බව දන්වා සිටිමි.

(ii)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
	• මුදල් රෙගුලාසි 214	668,508	සමාලෝචිත වර්ෂයට අදාල බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු බව.	රු. 668,560 ක් වූ බැරකම් මේ වනවිට බැරකම් ලැයිස්තුවේ සටහන් කර ඇත.
	• මුදල් රෙගුලාසි 396	324,702	නිකුත් කර මාස 06 ක් ඉකුත් වූ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් 11 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මාස 6 ඉක්මවූ රු.324,702 ක් වටිනා චෙක්පත් කඩිනමින් රාජ්‍ය අදායම වෙත බැරකිරීම ප්‍රායෝගිකව ගැටළුවක් පවතින අතර එම වටිනාකම් තාවකාලිකව තැන්පත් ගිණුමට මාරුකර ඇති අතර එම චෙක්පත් වල ගැටළු නිරාකරණයෙන් පසුව එම චෙක්පත් සියල්ල 2022 දෙසැම්බර් 31 දිනෙන් පසුව රාජ්‍ය ආදායමට බැර කරන බව දන්වා සිටිමි.
	• මුදල් රෙගුලාසි 1645(අ)		වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස උපදෙස් ලබා දෙන ලදී.

	• මුදල් රෙගුලාසි 1646	වාහන සඳහා දෛනික ධාවන සටහන් සෑම මාසයක් අවසන් වී එළැඹෙන මාසයේ 15 දිනට ප්‍රථම විගණනය වෙත ඉදිරිපත් කල යුතු වුවත් එසේ ඉදිරිපත් කර නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	එදිනෙදා ධාවන සටහන් සියල්ල ඉදිරියේදී සෑම මසකම 15 වෙනි දිනට ප්‍රථම විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
	• මුදල් රෙගුලාසි 1647	දෙපාර්තමේන්තුව සතු වාහන 06 ක් සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ලේඛනයේ ඇතුළත් කළ යුතු බව.	මුදල් රෙගුලාසි 1647 ප්‍රකාරව දෙපාර්තමේන්තුව සතු වාහන සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා එම වාර්තා විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.
(iii)	2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2022 පෙබරවාරි 22 දින වේ.	අදාල කාල සීමාවන් ඇතුළත් කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු බව.	ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට සටහන් කර ගනිමි.
(iv)	2006 දෙසැම්බර් 22 දිනැති අංක පිඑෆ් 423/දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.3 ඡේදය	දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල පාර්ලිමේන්තුවේ පනතක් මගින් නීත්‍යානුකූලව පිහිටුවා නොතිබුණු අතර චක්‍රලේඛය ප්‍රකාරව අරමුදල වසා දැමීමට හෝ නීත්‍යානුකූල තත්ත්වය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. එමෙන්ම අරමුදලට අදාල මූල්‍ය ප්‍රකාශන මෙතෙක්	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	හජ් අරමුදලට අදාලව 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර පාලක මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. එම අනුමැතියෙන් පසුව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

		විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වුවද, දෙපාර්තමේන්තුව විසින් 2021 වර්ෂය දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණද පාලක මණ්ඩලය විසින් අනුමත කර නොතිබුණු අතර 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට අනුව අරමුදලේ මුළු වත්කම් රුපියල් මිලියන 139.9 ක් විය.		
(v)	2015 ජූනි 29 දිනැති අංක 01/2015 හා 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ	අදාල චක්‍රලේඛවලට පටහැනිව මිල ගණන් කැඳවීමකින් තොරව දෙපාර්තමේන්තුව සතු අංක WP CAD - 9010 සහ WP KC - 5063 දරන වාහන 02 සෙලින්කෝ රක්ෂණ සමාගම වෙතින් රක්ෂණය කර තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	අංක WP-CAD 9010 හා WP-KC 5062 දරන වාහන දෙක ඉතා කඩිනමින් රක්ෂණය කිරීමේ අවශ්‍යතාව මත හා කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මිල ගණන් කැඳවීමට ප්‍රමාද වන බැවින් මිල ගණන් කැඳවීමකින් තොරව මෙම වාහන දෙක රක්ෂණය කරන ලදී.
(vi)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය			
	• 3.1 වගන්තිය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධයෙන් අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින්	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	වාහනවල ඉන්ධන පරීක්ෂාව කඩිනමින් සිදුකර එම වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

		මුලින්ම යෙදෙන අවස්ථාවකට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද සියළුම වාහන සම්බන්ධයෙන් එවැනි පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.		
	• 3.3 වගන්තිය	ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනාගැනීම සඳහා වක්‍රලේඛයෙහි ඇමුණුම 01 හි දක්වා ඇති ප්‍රවාහන සේවා සටහන් මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	වක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මාසික ඉන්ධන භාවිතයේ අහිතකර වෙනස්කම් තිබුණහොත් ප්‍රවාහන සේවා සටහන් මාසිකව සටහන් කර ඒ අනුව කටයුතු කිරීමට සටහන් කර ගනිමි.
(vii)	2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	වක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල සාමාජිකයින් විසින් ලබා ගත යුතුව පවතින නිපුණතා සහ නිපුණතා අතර පවතින පරතරය පියවීම සඳහා සිදු කළ යුතු මානව සම්පත් සංවර්ධනය අධ්‍යයනය කිරීමෙන් අනතුරුව දෙපාර්තමේන්තුවට අනන්‍ය වූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	වක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව.	මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිලියෙල කරමින් පවතින අතර ඉදිරි මාස දෙක ඇතුලත එය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරමි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) වැය විෂයයන් 11 කට අදාලව එකතුව රු. 49,000,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.16,721,479 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබූ අතර එම ඉතිරිය සියයට 24 සිට සියයට 72 දක්වා පරාසයක විය.	සපයා ගනු ලැබූ ප්‍රතිපාදන අදාල කාර්යයට යෙදවිය යුතු බව.	2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘති, කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීම ප්‍රමාද විය. ඊට අමතරව අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව අනිවාර්ය ඉතිරිකිරීම් මහා භාණ්ඩාගාරය වෙත වාර්තා කරන ලදී.
(ආ) වැය විෂයය අංක 2003 ට අදාලව ශුද්ධ ප්‍රතිපාදනය රු. 800,000 ක් වුවද මුළු වියදම රු. 249,857 ක් වීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු. 700,000 ක ප්‍රතිපාදන අවුරා තැබීමට සිදු වී තිබුණි.	අවශ්‍යතාවය අනුව ප්‍රතිපාදන ලබා ගත යුතු බව.	2003 යටතේ අනිවාර්ය ඉතිරිකිරීම රු 700,000 ක් ලෙස සඳහන් කලද ඊට පසුව අත්‍යවශ්‍ය බිල්පත් ලැබී තිබූ නිසා එම බිල්පත් සඳහා ගෙවීම සිදුකරන ලදී. ඒ තුලින් ප්‍රතිපාදන සීමාව ඉක්මවා ගොස් නොමැති අතර අවසන් ගිණුම්වල 2003 වැය විෂය යටතේ ඉතිරිය රු 550,143 ක් ලෙස පෙන්නුම් කෙරේ.

2.2 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.70,504 ක, විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.55,448 ක සහ සේවය හැර ගිය නිලධාරියෙකුගෙන් අය විය යුතු රු. 31,900 ක ණය මුදල් අවු.05 ක් ඉක්ම වුවද, අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු බව.	අවස්ථා ගණනාවකදී පියවර රාශියක් ගෙන තිබුණත් ණය ශේෂ අයකර ගත නොහැකි විය. තවදුරටත් ඒ සම්බන්ධ කටයුතු කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බැවින් ණය කපාහැරීමට භාණ්ඩාගාරයෙන් නැවත ඉල්ලීම් කිරීමට අපේක්ෂා කරමි.

2.3 තැන්පතු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වසර 02 සිට වසර 06 දක්වා කාලයක සිට පවතින එකතුව රු.17,422,508 ක් වූ තැන්පතු ශේෂ 17 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	අදාල තැන්පතු මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට බැර කිරීමට කඩිනමින් කටයුතු කළ යුතු බව.	රු.17,422,588 ක් වූ තැන්පතු 16 මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීමට අදාල රඳවා ගැනීමේ මුදල් වේ. ගොඩනැගිල්ලේ වැඩ කටයුතු මෙතෙක් නිමකර නොමැති නිසා අදාල කොන්ත්‍රාත් උපදේශන සමාගම වන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කර නොමැති බැවින් එම මුදල් නිදහස් කිරීමට හෝ රජයේ ආදායමට බැර කිරීමට හැකියාවක් නොමැති බව දන්වමි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන හජ් අරමුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා 2014 පෙබරවාරි 17 දින අංක 01/2014 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	පවත්නා තත්ත්වයන් මත වෙනස් විය හැකි වුවද ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු බව.	2019 -2020 වර්ෂවල හජ් වන්දනාව සිදුව නොමැති බැවින් 2021 වර්ෂයේදී හජ් අරමුදල සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර නොමැත.

3.2 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල ඉදිකර තිබූ දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම දෙපාර්තමේන්තුව නමට පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.	පවරා ගැනීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු බව.	වසර ගණනාවකට පෙර මෙම දෙපාර්තමේන්තුවට ලබා දී ඇති දුම්රිය දෙපාර්තමේන්තු ඉඩම ඉතා කඩිනමින් පවරා ගැනීම ප්‍රයෝගිකව ඉතා දුෂ්කර අතර මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය සමඟ සාකච්ඡා කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් ඇප තැබීමට කටයුතු කර නොතිබුණි.	අදාල විධිවිධාන ප්‍රකාරව ඇප තැබීමට කටයුතු කළ යුතු බව.	ඇප ආඥා පනත අනුව නිලධාරී විසින් ඇප තැබීමට කටයුතු කරමින් පවතී.

3.4 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයේ විගණනයට අදාලව නිකුත් කරන ලද විගණන විමසුම් 01 ක් සඳහා දෙපාර්තමේන්තුව විසින් මෙම වාර්තාවේ දිනය වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.	විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයිය යුතු බව.	පිළිතුරු එවීමට ප්‍රමාද වූ විගණන විමසුම් සඳහා කඩිනමින් පිළිතුරු එවීමට සටහන් කර ගනිමි.

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	තිරසර සංවර්ධන අරමුණු හඳුනාගත යුතු බව.	දෙපාර්තමේන්තු කමිටුවක් පත්කර තිරසර සංවර්ධනය පිළිබඳ ඔවුන්ගේ අවධානය යොමුකර මෙම දෙපාර්තමේන්තුවට අදාලව තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීමට අපේක්ෂා කරමි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අංක 38(ඊ) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වේ. මුදල් රෙගුලාසි 133 ප්‍රකාරවද ගණන්දීමේ නිලධාරි විසින් මුදල් රෙගුලාසි 128 හි දක්වා ඇති ස්වකීය රාජකාරී සහ වගකීම ඉටු කිරීම සඳහා තම දෙපාර්තමේන්තුව තුල අභ්‍යන්තර විගණන ඒකක පිහිටුවා ගත යුතුය. එසේ වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	විගණන පනත සහ මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව.	සුදුසු අභ්‍යන්තර විගණකවරයකු පත්කිරීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින බව දන්වා සිටිමි.

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 123 ක් වූ අතර දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්ය මණ්ඩලය 109 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 25 ක් සහ අතිරික්ත 11 ක් පැවතුණි. ඒ අතුරින් සහකාර අධ්‍යක්ෂ තනතුරු 04 ක් ද ගණකාධිකාරි සහ අභ්‍යන්තර විගණන තනතුරු දෙකද පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය කෙරෙහි බලපෑම් සිදු කරන බව නිරීක්ෂණය විය.	පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතු බව.	කාර්ය මණ්ඩලයේ පවතින පුරප්පාඩු ඉතා කඩිනමින් පිරවීමට අවශ්‍ය පියවර ගනිමින් සිටී.

133

(ආ)	දෙපාර්තමේන්තුවේ අනුමත රියැදුරු තනතුරු 04 ක් පැවතියද, රියැදුරන් තිදෙනෙකු පමණක් සේවයේ නියුතුව සිටීම හේතුවෙන් එක් පුරප්පාඩුවක් පැවතිණි. තවද, වාහන 06 ක් පැවතියද, රියැදුරන් 03 දෙනෙක් පමණක් සිටීම හේතුවෙන් නිරන්තරයෙන් වාහන 03 ක් නිශ්කාර්යව පවතින බව නිරීක්ෂණය විය.	රියදුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කර වාහන භාවිතය කාර්යක්ෂම කළ යුතු බව.	රියදුරු පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කිරීමට සටහන් කර ගනිමි.

එච්.එම්.රණසිංහ බණ්ඩා
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පර්ච්ඡේදය 04 — කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලසුම මත පදනම්ව)

විශේෂ දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	**75%-89%**	**50%- 74%**
මුස්ලිම් සමාජයේ සමගිය පෝෂණය කිරීම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා කටයුතු කිරීම	√		
ශුද්ධ වූ මිහරාජ් දිනයේ වටිනාකම් සහ යහපත් ගුණාංග ඉස්මතු කර දැක්වීම	√		
ඉස්ලාමීය ආගමික වතාවත් පැවැත්වීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම			√
මුස්ලිම්, බෞද්ධ, හින්දු සහ ක්‍රිස්තියානුවන් සඳහා මුහම්මද් නබි (සල්ලල්ලාහු අලෙයිහි වසල්ලම්) තුමාගේ චරිත පිළිබඳ දැනුවත් කිරීම		√	
මුස්ලිම් පල්ලි, අරාබි විද්‍යාල, අහදිය දහම් පාසල් සහ සංස්කෘතික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම	√		
අහදියා පාසල් ගුරුවරුන් දිරිගැන්වීම සහ අල් කුර්ආන් මද්‍රසා සඳහා අවශ්‍ය මූලික පහසුකම් සලසමින් දිරිමත් කිරීම		√	
ඉස්ලාමීය අධ්‍යාපනය වැඩි දියුණු කිරීම			√
මද්රසා(අරාබි පාසල්) ප්‍රතිසංස්කරණය කිරීම			√
නවක මුස්ලිම් ලේඛකයින් හඳුන්වා දීම හා දිරිගැන්වීම		√	
වකුෆ් පනතට අනුකූලව සියලුම මුස්ලිම් පල්ලි සහ පුණ්‍යාහාර පරිපාලනය සඳහා පහසුකම් හා සේවා සැපයීම.	√		
මුස්ලිම් කලා සම්ප්‍රදායන් 3ක් (පොල්ලඩි, කසීතා සහ පැකර් බයිත්) සංරක්ෂණය හා සංවර්ධනය	√		
නිලධාරින්ගේ දැනුම හා කුසලතා වැඩි දියුණු කිරීම		√	

පර්ච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (**SDG**) සපුරාගැනීමේ කාර්යසාධනය

5.1හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%-100%**
අරමුණු 4 **පරිපූර්ණ, සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම**	**4.1 2030 වන විට ඵලදායි ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියලුම ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් නිදහස්, සමාන හා ගුණාත්මකභාවයෙන් ඉහළ සහ ද්විතියික අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම.**	**4.1.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව (අ) 2/3 ශ්‍රේණි, (ආ) ප්‍රාථමික ශ්‍රේණි අවසානයේ සහ (ඇ) පහළ ද්විතීයික මට්ටම් වල ඉගෙනුම ලබන දරුවන් සහ යෞවනයන් අතර 1. කියවීමට සහ 11. ගණිතමය කුසලතාවය සඳහා වන අවම මට්ටම සහිත අයගේ ප්‍රමාණය**		√	

5.2 **තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ සහ අභියෝග**

2030 න්‍යාය පත්‍රය සඳහා වූ තිරසාර සංවර්ධන ඉලක්ක ගෝලීය ක්‍රියාවක් වන අතර එක්සත් ජාතීන් සිය සාමාජික රටවල් සඳහා තිරසාර සංවර්ධන ඉලක්ක 17 ක් හඳුන්වා දී ඇත. මෙම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ විවිධ සංවර්ධන කටයුතු සිදු කෙරේ. තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහ මෙම දෙපාර්තමේන්තුව මුස්ලිම් පල්ලිවල ස්වරූපයෙන් උරුමයන් සුරැකීමෙන් සහ ජාතික මට්ටමේ ආගමික හා සංස්කෘතික කටයුතු සංවිධානය කිරීමෙන් හා පහසුකම් සැලසීමෙන් තිරසර සංවර්ධනය සඳහා දායක වේ.

අභියෝග

- මුස්ලිම් පල්ලි හා සංස්කෘතික මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණයට සහ කලා හා සංස්කෘතික වැඩසටහන් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

6.1 සේවක සංඛ්‍යා කළමණාකරණය

විස්තරය	අනුමත සේවක සංඛ්‍යාව	සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු/ (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ මට්ටම	**09**	**03**	**06**
අධ්‍යක්ෂ	01	01	-
ගණකාධිකාරී	01	-	01
අභ්‍යන්තර විගණක (ශ්‍රීලගසේ)	01	-	01
නියෝජ්‍ය/ සහාකාර අධ්‍යක්ෂ (ශ්‍රීලපසේ)	04	02	02
නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රීලපසේ නොවන)	02	-	02
තෘතීයික මට්ටම	**02**	**-**	**02**
පරිපාලන නිලධාරී	01	-	01
භාෂා පරිවර්තක	01	-	01
ද්විතියික මට්ටම	**95**	**93**	**02**
වකුග් මණ්ඩල ලේකම්	01	-	01
වකුග් විනිශ්චය සභා ලේකම්	01	-	01
සංවර්ධන නිලධාරී	71	76	(05)
කළමනාකරණ සේවා නිලධාරි	22	17	05
ප්‍රාථමික මට්ටම	**17**	**11**	**06**
රියදුරු	04	03	01
කා.කා.ස.	13	08	05
එකතුව	**123**	**107**	**16**

6.2 මානව සම්පත් හිඟය ආයතනයේ කාර්යසාධනය කෙරෙහි බලපා ඇති ආකාරය.

මානව සම්පත් සංවර්ධනය, කාර්ය සාධනය සහ ජයග්‍රහණ සඳහා දෙපාර්තමේන්තුවට ඉතා වැදගත් වේ. දෙපාර්තමේන්තු නිලධාරීන් දෙපාර්තමේන්තුවේ කොදු නාරටිය වන බැවින් ජ්‍යෙෂ්ඨ මට්ටම, ප්‍රාදේශීය මට්ටම, ද්විතියික මට්ටම සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයේ හිඟය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වයට බෙහෙවින් බලපානු ඇත. සේවක හිඟය පිළිබඳ තොරතුරු රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට දන්වා පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඉල්ලීම් කර ඇත. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඉතා අභියෝගාත්මක වසරක් මධ්‍යයේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහළ නැංවීමට ද්විතියික මට්ටමේ කාර්ය මණ්ඩලය ඉමහත් දායකත්වයක් ලබා දී තිබීම විශේෂත්වයකි.

6.3 මානව සම්පත් සංවර්ධනය

	වැඩසටහනේ නම	සහභාගී කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.' 000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබා ගත් දැනුම
				දේශීය	විදේශීය		
1	කාර්යාල පද්ධතිය සහ මූල්‍ය නියාමනය පිළිබඳ පුහුණුව	40	2 Days	136.9	-	Local	ක්‍රියාකලාපයන්හි වෙනස්කම් සහ කාර්ය සාධනය මත වැඩිදියුණු විය
2	ගිණුම් නිලධාරියාගේ යුතුකම සහ වගකීම	2	2 Days	14	-	Local	කාර්ය සාධනය වැඩි දියුණු වීම.
3	රාජ්‍ය පරිපාලන පුහුණුව	1	1 Year	150	-	Local	රාජ්‍ය පරිපාලනය පිළිබඳ දැනුම හා කුසලතා ලබා ගැනීම
4	මූල්‍ය කළමනාකරණයේ ක්‍රියාවලිය	1	2 days	8	-	Local	දැනුම හා කුසලතා ලබා ගැනීම
5	තොරතුරු තාක්ෂණය සහ රාජ්‍ය අංශයේ කළමනාකරණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව	6	1 Year	180	-	Local	දැනුම හා කුසලතා ලබා ගැනීම
6	ගිනි නිවන දැනුවත් කිරීමේ වැඩසටහන	60	1 Day	21.4	-	Local	ගිනි වැළැක්වීම සහ ගිනි ආරක්ෂණය සම්බන්ධයෙන් දැනුම ලබා ගැනීම.

*** කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන ආයතනයේ කාර්ය සාධනයට දායක වේ.**

ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් නිලධාරීන්ගේ උපරිම මට්ටමින් ඔවුන්ගේ ධාරිතාව ඉහළ නැංවීමට සහාය වී ඇත. ඒ අතරම, බොහෝ ව්‍යාපෘති පහසුවෙන් සංවිධානය කිරීමට සහාය වන කාර්ය මණ්ඩලය අතර කණ්ඩායම් ගොඩනැගීම ද වර්ධනය විය. එබැවින් ධාරිතා වර්ධනය පාරිභෝගිකයන් තෘප්තිමත් කරනු ලැබේ. එබැවින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරකම් සැලසුම් කර ක්‍රියාත්මක කරමින් දෙපාර්තමේන්තු කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීමට නිලධාරීන් දායක වේ.

පරිච්ඡේදය 07-අනුකූලතා වාර්තාව

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
01	**පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශන /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශන	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
02	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මූල්‍ය රෙගුලාසි 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛනය/ පුද්ගලික පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළු මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
2.9	භානි පාඩු ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛණය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූල්‍ය රෙගුලාසි 135))**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරා දීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබ ද ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	එක් එක් ගනුදෙනුව නිලධාරීන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක හරහා සිදුවන ආකාරයෙන් බලතල අභිනියෝජනය කරනු ලැබ තිබේ.	අනුකූල වේ		
3.4	රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කරමින් 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ 171/2004 ප්‍රකාරව ගණකාධිකාරී විසින් පාලනයන්ට අනුකූලව කටයුතු කිරීම.	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අ.වි.අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මූල්‍ය රෙගුලාසි 134(2) DMA/1-2019 අනුව විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සකස් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩු වීම	පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අ.වි.අංශයක් ස්ථාපිත කිරීමට කටයුතු කර ඇත.
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගනණ පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ		
6.4	මූල්‍ය රෙගුලාසි 134 (3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල සියලු පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටුව**			
7.1	කළමනාකරණ ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වසර තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් හතරක් පවත්වා තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 හි 07 වන ඡේදය අනුව වත්කම් මිල දී ගැනීම හා අපහරණය පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජෙනරාල්ගේ කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත කී චක්‍රලේඛයේ 13වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස සුදුසු සම්බන්ධීකරණ නිලධාරියකු පත් කර තිබීම හා එසේ නම් කරනු ලැබූ නිලධාරියාගේ විස්තර කොම්ප්ට්‍රොලර් ජෙනරාල්ගේ කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණය නියමිත දිනට පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.4	9 නිශ්චිතව දක්වා ඇති කාල සීමාවන් තුළ ඉටු කර තිබීම.	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මූල්‍ය රෙගුලාසි 772 අනුව සිදුකර තිබීම.	අනුකූල වේ		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කර නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 6කට වඩා අඩු කාලයක් තුළ අපහරණය කර තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මූල්‍ය රෙගුලාසි 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 අනුව වාහනවල ඉන්ධන දහනය නැවත පරීක්ෂා කර තිබීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව කල්බදු වාහනවල ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අදාල නොවේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශනවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මූල්‍ය රෙගුලාසි 94(1) අනුව බැරකම්වලට එළඹීම වසර අවසානයේදී ඉතිරිව පැවැති ප්‍රතිපාදන ඉක්මවා නොයාම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නිරවුල් කිරීමට කටයුතු කරමින් සිටී	ස්ථාන මාරු වී මාස තුනක් තුල ණය අයකර ගැනීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මූල්‍ය රෙගුලාසි 571 අනුව ක්‍රියාමාර්ග ගෙන තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මූල්‍ය රෙගුලාසි 371 ප්‍රකාරව නිකුත් කල තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරාකරණය කර තිබීම	අනුකූල වේ		
14.3	මූල්‍ය රෙගුලාසි 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකර තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොඩ සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම.	අනුකූල වේ		
15.3	මූල්‍ය රෙගුලාසි 176 ප්‍රකාරව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති අංක 04/2017 චක්‍රලේඛය ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා මහජනතාව වෙත ලබා දී තිබීම සහ වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා රාජ්‍ය අධිකාරියක් ලෙස ආයතනය පිළිබඳ මහජනතාවගේ චෝදනා/ ප්‍රශංසා පළ කිරීම සඳහා පහසුකම් සැපයීමට ක්‍රියා මාර්ග ගෙන තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 සහ 10 වගන්ති ප්‍රකාරව අර්ධ වාර්ෂික හා වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අංක 05/2008 සහ අංක 05/2008 (1) චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාදායක ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීමේ ඇගයීම පිණිස ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර තිබීම.	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 02හි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලැස්මක් සකස් කර තිබීම	අනුකූල නොවේ		
19.2	ඉහත කී මානව සම්පත් සැලැස්මේ කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු අවම පුහුණු අවස්ථා සහතික කර තිබීම.	අනුකූල වේ		
19.3	ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01 හි ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		

අංකය.	අදාළ අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ, ක්‍රියාමාර්ග
19.4	ඉහත කී චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම පිළිබඳ වගකීම සඳහා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කර පවරා තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		